(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **53.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 සැප්තැම්බර් 05 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **මනුෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු  නීතිඥ තලතා අතුකෝරල මහත්මිය

ගරු  සම්පත් අතුකෝරල මහතා

ගරු  තිස්ස අත්තනායක මහතා

ගරු  හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු  රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු  වජිර අබේවර්ධන මහතා

ගරු  අශෝක් අබේසිංහ මහතා

ගරු  (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු  තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු  මායාදුන්න චින්තක අමල් මහතා

ගරු  ජේ. සී. අලවතුවල මහතා

ගරු  ඩලස් අලහප්පෙරුම මහතා

ගරු  මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු  යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු  (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු  සංජීව එදිරිමාන්න මහතා

ගරු  අකිල එල්ලාවල මහතා

ගරු  ලලිත් එල්ලාවල මහතා

ගරු  සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු  ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු  ගයන්ත කරුණාතිලක මහතා

ගරු  නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු  ෆයිසාල් කාසිම් මහතා

ගරු  ජයන්ත කැටගොඩ මහතා

ගරු  නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු  උදයන කිරිඳිගොඩ මහතා

ගරු  ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු  කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු  වේලු කුමාර් මහතා

ගරු  කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු  නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු  මනෝ ගනේෂන් මහතා

ගරු  උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු විමලවීර දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු  රෝහණ බංඩාර මහතා

ගරු  ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු  (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු  රිසාඩ් බදියුදීන් මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  ඉම්රාන් මහරුෆ් මහතා

ගරු  ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  මොහමඩ් මුසම්මිල් මහතා

ගරු  නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු  නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු  පාඨලී චම්පික රණවක මහතා

ගරු  (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු  සී. බී. රත්නායක මහතා

ගරු  අලි සබ්රි රහීම් මහතා

ගරු  ඉෂාක් රහුමාන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු  නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු  උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු  (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු  එම්. රාමේෂ්වරන් මහතා

ගරු  නිමල් ලාන්සා මහතා

ගරු  ගාමිණී ලොකුගේ මහතා

ගරු  ගාමිණී වලේබොඩ මහතා

ගරු  ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු  රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු  චමින්ද විජේසිරි මහතා

ගරු  එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු  නීතිඥ මධුර විතානගේ මහතා

ගරු  හේෂා විතානගේ මහතා

ගරු  නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු  විමල් වීරවංශ මහතා

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'දේශීය ආදායම් (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද තීන්දුව මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සපයා ඇති කරුණු අනුව, පනත් කෙටුම්පත හෝ එහි විධිවිධාන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 ව්‍යවස්ථාව හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන් කිසිදු විධිවිධානයකට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ඒ අනුව, මෙම පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායකයේ සරල බහුතරයකින් නීත්‍යානුකූල ලෙස සම්මත කළ හැකි ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි."

II

"පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා, ගරු එස්. බී. දිසානායක මහතා සහ ගරු ධම්මික පෙරේරා මහතා, ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 සැප්තැම්බර් 01 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු නිමල් ලාන්සා මහතා, ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා සහ ගරු මංජුලා දිසානායක මහත්මිය එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

III

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 සැප්තැම්බර් 01 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සංජීව එදිරිමාන්න මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

IV

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින් 2023 ජූලි 18 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය."

V

"පාර්ලිමේන්තුවේ සභානායක ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් 2023 අගෝස්තු 25 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය."

2. **ලිපිලේඛනාදිය පිළිගැන්වීම**: (1) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූනි 02 දිනැති අංක 2334/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර එම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් (451 අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 24(1) (ජ), (ට) සහ (ඩ) වගන්ති සමඟ කියවිය යුතු 64(2) (ඊ) වගන්තිය, 23අ, 23ආ, 23ඇ, 23ඈ සහ 28(3) වගන්ති සමඟ කියවිය යුතු 64(1) වගන්තිය, 24 (1) වගන්තිය, 3අ වගන්තියේ (3), (4) සහ (5), 6 සහ 64 වගන්ති, 3(4) වගන්තිය සහ 64 වගන්තිය සහ 58 හා 59 වගන්ති සමඟ කියවිය යුතු 64 වගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරිය විසින් සාදන ලදුව 2023 අගෝස්තු 21 දිනැති අංක 2346/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර එම නියෝග වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 ජූලි 04 දිනැති අංක 2339/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර එම නියෝග අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ 4(1)(ඊ) වගන්තිය යටතේ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 අගෝස්තු 26 දිනැති අංක 2294/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය ඉදිරිපත් කර එම නිවේදනය වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3. **කාරක සභා වාර්තා පිළිගැන්වීම**: (1) ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් "ජාතික ආර්ථිකය නගා සිටුවීම සඳහා බදුකරණය විධිමත් කිරීම" සම්බන්ධයෙන් සකස් කරන ලද වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මයන්ත දිසානායක මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා විසින් එම කාරක සභාවට යොමු කරන ලද ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

4. **මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) අම්බලන්තොට, රන්ගිරි විහාර පාර, 24/2-24/3 දරන ස්ථානයෙහි පදිංචි ඩී.මුනිදාස මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු 2023.02.13 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) කැබිතිගොල්ලෑව, හඳවල පාර, අංක 108 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.ඒ හේරත් මහතාගෙන් ලැබුණු 2023.06.27 දිනැති පෙත්සම; සහ

(ii) තඹුත්තේගම, එච්.එන්.බී බැංකුව ඉදිරිපිට යන ලිපිනයෙහි පදිංචි පිලිප් දිසානායක මහතාගෙන් ලැබුණු 2023.07.18 දිනැති පෙත්සම

ගරු එච්. නන්දසේන මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**5. සිවිල් ගුවන් සේවා (සංශෝධන):** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් 19 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු සංජීව එදිරිමාන්න මහතා, ගරු අකිල එල්ලාවල මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"වල්පොල පියනන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත, අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**7. ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත:—** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය"යි සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ.භා. 12.06 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.07 ට ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා, ගරු වාසුදේව නානායක්කාර මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.14 ට ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනාරූඪ විය.)

"ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.12 ට ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.00 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවට අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 29 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"1961 අංක 31 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

2. 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ දීර්ඝ නාමය එහි, "ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර" යන වචනවල සිට " ආරෝග්‍යශාලා මණ්ඩලයක් පිහිටු වීම සඳහා ද;" යන වචන දක්වා ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"ආයුර්වේද රෝහල්, ආයුර්වේද ඔසුසල්, ආයුර්වේද බෙහෙත් ශාලා, ආයුර්වේද ගබඩා, ඔසු වගා සහ පර්යේෂණ සහ ව්‍යාප්තිය සඳහා වන ඔසු උයන් ලියාපදිංචි කිරීම සඳහා ද; ආයුර්වේද වෛද්‍යවරයන්, ආයුර්වේද ඖෂධවේදීන්, ආයුර්වේද හෙද හෙදියන් සහ ආයුර්වේද සම්බාහන ශිල්පීන් ලියාපදිංචි කිරීමට සහ ඔවුන්ගේ වෘත්තීය පැවැත්මට අදාළ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ආයුර්වේද වෛද්‍ය සභාවක් පිහිටුවීම සඳහා ද; ආයුර්වේද අධ්‍යාපනය හා පුහුණුවට අදාළ අභිඥාන පත්‍ර, සහතිකපත්, උපාධි සහ පශ්චාත් උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ඇතැම් කර්තව්‍ය ඉටු කිරීම පිණිස ද ආයුර්වේද ජාතික රෝහල, ආයුර්වේද ශික්ෂණ රෝහල්, ආයුර්වේද පර්යේෂණ රෝහල් සහ ඊට අනුබද්ධ ඔසුසල්, ඖෂධ නිධි සහ බෙහෙත් ශාලාවලට අදාළ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද;"."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 21 වැනි පේළිය සහ 22 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ආරෝග්‍යශාලා මණ්ඩලයක් පිහිටුවීම සඳහා; ජාතික ආයුර්වේද රෝහල, ආයුර්වේද ශික්ෂණ රෝහල් ආයුර්වේද පර්යේෂණ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 34 වැනි පේළිය සහ 35 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ආයුර්වේදය හෙද සේවකයන්ට", "ජාතික ආයුර්වේදය රෝහලට" සහ "ආයුර්වේද පර්යේෂණ කමිටුවට"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වෙනුවට පිළිවෙළින්, ආයුර්වේද අධ්‍යක්ෂ ජනරාල්වරයා"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 14 වැනි පේළිය සහ 15 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"අතිරේක ආයුර්වේද අධ්‍යක්ෂ ජනරාල්වරු, ආයුර්වේද අධ්‍යක්ෂවරු, වන වචන"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය සභා සම්මත විය.

6 වැනි වගන්තිය

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 24 වැනි පේළිය සහ 25 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආයුර්වේද අධ්‍යක්ෂකවරු, නියෝජ්‍ය ආයුර්වේද අධ්‍යක්ෂකවරු යන වචන ආදේශ කිරීමෙන් ඒ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 30 වැනි පේළියේ සිට 34 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) ආයුර්වේදයට අනුව,

(i) රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය ආයතන පිහිටුවීම සහ සේවා සැපයීම; සහ

(ii) "ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණය සැපයීම";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 28 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ව්‍යාප්තිය සඳහා වන ඖෂධ උයන් හෝ ඖෂධ වගා";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 4 වැනි පේළිය සහ 5 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වෛද්‍ය පශ්චාත් උපාධි සහ සම්බාහන පුහුණු පාඨමාලා හැදෑරීම හා පර්යේෂණ, ප්‍රකාශන පලකිරීම් සඳහා පැවැති එවැනි ආයතන හා පුද්ගලයන්ට"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 11 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"මෙම පනත යටතේ ස්ථාපනය කරන"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 12 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(ඉ) ඖෂධ ලියාපදිංචිය හා නියාමනය මඟින් නිෂ්පාදනය, ගෙන්වීම, බෙදාහැරීම, ගබඩා කිරීම සහ වගා කිරීම මඟින් ඖෂධ කළමනාකරණය කිරීම;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඊ) ආයුර්වේද සෞඛ්‍ය සේවා සපයන වෘත්තිකයන් ලියාපදිංචිය, වෘත්තීය කටයුතු හා ක්‍රියාකාරකම් නියාමනය හා අධීක්ෂණය කිරීම මඟින් ඉහළ වෘත්තීය ප්‍රමිති සහතික කිරීම;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 20 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(උ) වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධව හා අනෙකුත් සහායක සේවා සම්බන්ධව විශ්ව විද්‍යාල ආයතන සහ රජයේ අනුමත වෙනත් ආයතන වෙත එහි උගන්වනු ලබන පාඨමාලා, ආයතන පහසුකම් හා මානව සම්පත් පිළිබඳ කලින් කලට නිර්ණායක, උපමාන හා උපදෙස් ලබාදීම මඟින් ගුණාත්මක තත්ත්වයේ ඉහළ වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම සහ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8 වැනි වගන්තිය

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා වැනි පේළි ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 13 වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"9. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි " 7 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී, කොමසාරිස්වරයා" යන වචන වෙනුවට, "7 වන වගන්තියේ (අ) සිට (ඉ) දක්වා ඡේදවල නිශ්චිතව දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට බලය තිබිය යුතු අතර එසේ කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි "ආයුර්වේද ආරෝග්‍යශාලා" යන වචන වෙනුවට "ආයුර්වේද රෝහල්, පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා සඳහා වූ ඔසු උයන්" යන වචන ආදේශ කිරීමෙන්.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 12 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 7වන වගන්තියට ඉණික්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

7(අ) (1) ඒකාබද්ධ අරමුදලින් වරින් වර ප්‍රදානය කරනු ලබන මුදල්, පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත යුතුය.

(2) පනතේ නිශ්චිතව දක්වා ඇති අරමුණු ඉටු කිරීමේදි සහ දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය ඉටු කිරීමේදී ගාස්තු හෝ වෙනත් යම් ආකාරයකින් ලැබෙන්නා වූ අයකර ගන්නා වූ හෝ රැස්කරන්නා වූ සියලු මුදල්, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" 10. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය-

(1) එහි "ආයුර්වේද ආරෝග්‍යශාලා" යන වචන දැක්වෙන කවර හෝ තැනක, ඒ වෙනුවට "ආයුර්වේද රෝහල්, ඔසු වගා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි "ආයුර්වේද ආරෝග්‍යශාලාව" යන වචනය දැක්වෙන සෑම තැනක, ඒ වෙනුවට, "රෝහල, ඔසු වගා" යන වචන ආදේශ කිරීමෙන්";

(3) එහි "ආරෝග්‍යශාලාව" යන වචනය දැක්වෙන සෑම තැනක, ඒ වෙනුවට, "රෝහල, ඔසු වගා" යන වචන ආදේශ කිරීමෙන්";

මෙයින් සංශෝධනය කරනු ලැබේ.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 19 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ආයුර්වේද රෝහල් ඔසු වගා, ආයුර්වේද ඔසු සල් යන වචන ආදේශ කිරීමෙන් ඒ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 3 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) (i) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ආයුර්වේද හා යුනානි වෛද්‍ය අංශ නියෝජනය කරමින් එහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් තෝරා පත්කර ගත් සාමාජිකයන් දෙදෙනෙකු;

(ii) ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් විසින් ඔවුන් අතරෙන් තෝරා පත්කර ගත් එක් සාමාජිකයකු;

(iii) ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් තෝරා පත්කර ගත් එක් සාමාජිකයකු; සහ

(iv) ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් තෝරා පත්කර ගත් එක් සාමාජිකයකු,

ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකු;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 13 වැනි පේළියේ සිට 18 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(3) එහි (ඊ) ඡේදය ඉවත්කොට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන දොළොස් දෙනෙකුට නොවැඩි සාමාජිකයන්-

(i) එසේ පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් තිදෙනෙකු, ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරු නොවන තැනැත්තන් අතරින් ද;

(ii) එසේ පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් තිදෙනෙකු, සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සංගමය විසින් නාමයෝජිත දස දෙනෙකුගෙන් යුතු මණ්ඩලයක් අතරින් ද;

(iii) එසේ පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් දෙදෙනෙකු සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සංගමයේ සාමාජිකයන් නොවන ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් ද;"
විය යුතුය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 4 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"නියෝජනය කරමින් එක් නියෝජිතයෙකු බැගින් දෙදෙනෙකු"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(උ) නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහ මුදල් හෝ භාණ්ඩාගාර"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි වගන්තිය සභා සම්මත විය.

13 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 7 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"සභාපතිවරයාට යැවීමෙන්;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"රැස්වීම් තුනකට නොපැමිණි අවස්ථාවක දී;

(ඇ) ඔහු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකුව සිටීම අවසන් කළ විට හෝ ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් ඔහුගේ ලියාපදිංචිය අත්හිටුවමින් සභාව විසින් මේ පනත යටතේ කරන ලද නියමයක් ක්‍රියාත්මක වූ විට; සහ

(ඈ) ඔහු දණ්ඩ නීති සංග්‍රහය යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ විට,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තිය සහ 15 වැනි වගන්තිය සභා සම්මත විය.

16 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 9 වැනි පිටුවේ 27 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඉ) උසස් අධ්‍යාපනය විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන -

(i) එයින් සාමාජිකයන් දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ආයුර්වේද හා යුනානි වෛද්‍ය අංශ නියෝජනය කරමින් ද;

(ii) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයෙන් ද;

(iii) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයෙන් ද; සහ

(iv) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයෙන් ද,

යන ලෙස එක් එක් පීඨයේ හෝ ඒකකයේ කථිකාචාර්යවරයන් අතරින් වන්නා වූ සාමාජිකයන් පස් දෙනෙකු;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවට අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ඊ) (ඉ) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයන් නොවන-

(i) එයින් සාමාජිකයන් දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ආයුර්වේද හා යුනානි වෛද්‍ය අංශ නියෝජනය කරමින් ද;

(ii) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයෙන් ද;

(iii) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයෙන් ද; සහ

(iv) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයෙන් ද,

යන ලෙස එක් එක් පීඨයේ හෝ ඒකකයේ කථිකාචාර්යවරුන් විසින් ඔවුන් අතරින් තෝරා පත්කර ගත් සාමාජිකයන් පස් දෙනෙකු;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 19 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

'' (8) එහි (එ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

''(එ) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද, එසේ පත් කරනු ලැබිය යුතු තැනැත්තන්ගෙන් දෙදෙනෙකුට නොඅඩු තැනැත්තන් සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සංගමය විසින් නාමයෝජිත හය දෙනෙකුගෙන් යුතු මණ්ඩලයක් අතරින් වන්නා වූ ද, අට දෙනෙකුට නොඅඩු වන්නා වූ සාමාජිකයන්;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 20 වැනි පේළියේ සිට 29 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 33 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

" සහ ආයුර්වේද අතිරේක අධ්‍යක්ෂකවරු හා ආයුර්වේද අධ්‍යක්ෂවරු"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වෛද්‍ය පීඨයේ පීඨාධිපති සහ පීඨාධිපති නියෝජනය වන වෛද්‍ය උපාධි පාඨමාලාව හැර අනෙක් වෛද්‍ය උපාධි පාඨමාලා දෙපාර්තමේන්තු ප්‍රධානීන් අතුරින් පීඨාධිපති විසින් නම් කරන නියෝජිතයා,"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 10 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"ඒකකයේ ප්‍රධානියා, කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා "

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 17 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) "ජාතික ආයුර්වේද රෝහලේ ප්‍රධානියා""

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 2 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කතිකාචාර්යවරු අතරින් ඒ ඒ ආයුර්වේද, සිද්ධි, යුනානි වෛද්‍ය උපාධි පාඨමාලා නියෝජනය වන ලෙස එක් එක් පාඨමාලාවෙන් ඔවුන් විසින් තෝරාගනු ලබන එක් සාමාජිකයෙකු බැගින් සාමාජිකයන් පස් දෙනෙක්; ,"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17 වැනි වගන්තිය

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 11 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ජාතික ආයුර්වේද රෝහලේ ප්‍රධානියා හෝ දේශීය වෛද්‍ය ක්‍රම"

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

“වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

18 වැනි වගන්තිය

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 11 වැනි පිටුවේ 27 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“වෛද්‍ය ඒකකයේ සහ ජාතික ආයුර්වේද රෝහලේ ප්‍රධානීන්”

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

“වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

19 වැනි වගන්තිය සභා සම්මත විය.

20 වැනි වගන්තිය

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 12 වැනි පිටුවේ 27 වැනි පේළියේ සිට 35 වැනි පේළිය දක්වා වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“(අ) (1) වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ විශ්වවිද්‍යාල වල මූලික උපාධි හා පශ්චාත් උපාධි ප්‍රදානය කරනු ලැබීම සඳහා ද අනෙකුත් සහයක වෘත්තීන්ගේ පාඨමාලා වල අධ්‍යයන කරනු ලැබීම පිණිස ඉටුකළ යුතු නියම හා කොන්දේසි පිළිබඳ විශ්වවිද්‍යාල සහ සහයක වෘත්තීන්ගේ පුහුණු ආයතන සමඟ වැඩපිළිවෙලක් යොදා ගැනීම;

(ii) මෙම පනත යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි සඳහා සලකා බැලිය යුතුවීම පිණිස විශ්වවිද්‍යාල ආයතන මඟින් පවත්වන ලබන මූලික උපාධි, පශ්චාත් උපාධි සහ අනෙකුත් සහයක වෘත්තීන් ලියාපදිංචිය සඳහා සලකා බැලිය යුතු වීම පිණිස විශ්වවිද්‍යාල හෝ පිළිගත් රාජ්‍ය ආයතනයක් මඟින් පවත්වනු ලබන මූලික උපාධි පශ්චාත් උපාධි ඩිප්ලෝමා, සහතික පත්‍ර පාඨමාලාවල අධ්‍යාපන පද්ධති නිශ්චය කිරීම, ප්‍රමිති කිරීම, පිළිගැනීම හා අනුමත කිරීම”

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 13 වැනි පිටුවේ 1 වැනි පේළිය සහ 2 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“(iii) රාජ්‍ය සේවයෙහි නියුතු වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩයිම් විභාග හා මෙම පනත යටතේ ලියාපදිංචිය සඳහා සලකා බලනු ලබන සම්භාහන වෘත්තිකයන් සඳහා වන පාඨමාලාවල විභාග පැවැත්වීම සහ දේශීය හෝ විදේශීය ”

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 13 වැනි පිටුවේ 15 වැනි පේළිය සහ 16 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වෛද්‍ය ලියාපදිංචිය සඳහා වෛද්‍ය උසස් අධ්‍යාපනය සඳහා අවශ්‍ය තැනැත්තන්ට මූලික උපාධි හෝ පශ්චාත් උපාධි ලබා ගැනීමට සම්බාහක පාඨමාලා සම්බන්ධ සහතික පත්‍ර ලබා ගැනීමට තැනැත්තන්ට" යන වචන ආදේශ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

21 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 8 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨය නියෝජනය කරමින් එකී එක් එක් විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විෂයය සඳහා වන මහාචාර්යවරු සිව් දෙනෙකු;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 14 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(එ) විශේෂ නාම ලේඛනයේ ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයන් දෙදෙනෙකු; සහ

(ඒ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 14 වැනි පිටුවේ 29 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යන සාමාජිකයන් දා හතර දෙනෙකුගෙන් සමන්විත විය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 5 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ආ) ජාතික ආයුර්වේද රෝහලේ ප්‍රධානියා;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 14 වැනි පිටුවේ 8 වැනි පේළිය සහ 9 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) කොළඹ විශ්ව විද්‍යාලය, ගම්පහ වික්‍රමආරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ, යාපනය විශ්ව විද්‍යාලය"

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 14 වැනි පිටුවේ 11 වැනි පේළිය සහ 12 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“යන එක් එක් විශ්ව විද්‍යාල, කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂක සහ “සියලු මූලික උපාධි වෛද්‍ය පාඨමාලා නියෝජනය වන පරිදි මාහාචාර්යවරු 06 දෙනෙකු;”

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 14 වැනි පිටුවේ 22 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා පේළි ඉවත් කරන්න.

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22 වැනි වගන්තිය සහ 23 වැනි වගන්තිය සභා සම්මත විය.

24 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 15 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“24. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය අලුතින් එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 16 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 6 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

25 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 16 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

26 වැනි වගන්තියේ සිට 41 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

42 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 26 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඒ) වගා කිරීම සඳහා බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් අවශ්‍ය වන යම් ඖෂධීය පැළෑටියක් ප්‍රකාශයට පත් කිරීම; සහ

(ඕ) ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

43 වැනි වගන්තිය සභා සම්මත විය.

44 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 27 වැනි පිටුවේ 15 වැනි පේළිය සහ 16 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 27 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ ආයුර්වේදයේ නියැලි සිටිය දී මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීති උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ එකකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 27 වැනි පිටුවේ 36 වැනි පේළිය සහ 37 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ එකකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලසීමාවක්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 28 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''නොමැතිව කරගෙන යන්නේ නම්; හෝ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 28 වැනි පිටුවේ 22 වැනි පේළිය සහ 23 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාල සීමාවක්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

45 වැනි වගන්තිය සභා සම්මත විය.

46 වැනි වගන්තිය

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 30 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 11 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ආයුර්වේද'' යන්නට, ආයුර්වේද, සිද්ධ, යුනානි, සහ දේශීය චිකිත්සා වෛද්‍යකර්ම සහ ශල්‍යකර්මය ද වෙනත් යම් ආසියාතික රටවලට ආවේණික හා ඒ අදාළ රටවල රජයන් විසින් පිළිගත් වෙනත් යම් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ද ඇතුළත් වේ;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 30 වැනි පිටුවේ 12 වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවට අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 31 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 21 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ඔසු වගාව" යන්නෙන්, ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ නියම කරන ලද ආයුර්වේද කාර්ය සඳහා වන යම් ඖෂධීය ශාක වගාවක් අදහස් වන අතර එයට, වාණිජමය කාර්ය සඳහා යොදා ගැනෙන එවැනි වගාවක ඵලදාව, අස්වැන්න හෝ අවශේෂ ද අයත් වේ;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 31 වැනි පිටුවේ 27 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(5) ස්වදේශීය වෛද්‍ය රෝහල" යන යෙදුමේ අර්ථනිරූපණයට;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවට අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 32 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණය" යන්නෙන්, ජනතාවගේ අවශ්‍යතා කේන්ද්‍රකොට ගනිමින් සහ රෝග වැළැක්වීමේ සිට ප්‍රතිකාරය, පුනරුත්ථාපනය, සහ උවටැන් සැලසීම දක්වා කාරණා අඛණ්ඩව පවත්වාගනිමින් ජනතාවගේ දෛනික පරිසරයට හැකි පමණ සමීපවන ලෙස හැකි උපරිම තලයේ සෞඛ්‍ය සහ සුඛසාධනය මෙන්ම ඒවායේ සාධාරණ බෙදීයාමත් සහතික කිරීම අරමුණු කොටගත් නිරෝගී බව සඳහා වූ සමස්ත සාමාජයීය ප්‍රවේශයක් අදහස් වේ;

(6) "ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාමලේඛනය" යන යෙදුමේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 32 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 21 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලියාපදිංචි ආයුර්වේද සම්බාහන ශිල්පියා" යන්නෙන්, මේ පනත යටතේ ආයුර්වේද සම්බාහන ශිල්පියකු ලෙස ලියාපදිංචි තැනැත්තකු අදහස් වේ;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 32 වැනි පිටුවේ 22 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 33 වැනි පිටුවේ 4 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"4 වන වගන්තියේ ආයුර්වේද අධ්‍යක්ෂකවරු යන්නට අවස්ථානෝචිත පරිදි "අතිරේක ආයුර්වේද අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික), අතිරේක ආයුර්වේද අධ්‍යක්ෂ ජනරාල් (පාලන), ආයුර්වේද අධ්‍යක්ෂක (ආයුර්වේද සෞඛ්‍ය සේවා), ආයුර්වේද අධ්‍යක්ෂක (ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය), ආයුර්වේද අධ්‍යක්ෂ (පුද්ගලික සේවා), ආයුර්වේද අධ්‍යක්ෂ (මූල්‍ය), ආයුර්වේද අධ්‍යක්ෂ (පාලන), ආයුර්වේද අධ්‍යක්ෂ (සැලසුම්). ආයුර්වේද අධ්‍යක්ෂක (යුනානි), ආයුර්වේද අධ්‍යක්ෂක (සිද්ධ), ආයුර්වේද අධ්‍යක්ෂක (පාරම්පරික) යන වචන ඇතුළත් විය යුතුය."

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

47 වැනි වගන්තිය සහ 48 වැනි වගන්තිය සභා සම්මත විය.

**පොදු සංශෝධන**

සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පහත සඳහන් පොදු සංශෝධන ඉදිරිපත් කරන ලදී:—

(1) ''ආයුර්වේද හෙද සේවකයන්'' යන වචන කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම, ඒ වෙනුවට, ''ආයුර්වේද හෙද හෙදියන්'' යන වචන අදේශ කිරීමෙන්;

(2) ''ආයුර්වේද හෛසජ්ජක'' සහ ''හෛසජ්ජක'' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම, ඒ වෙනුවට, ''ආයුර්වේද ඖෂධවේදී'' සහ ''ඖෂධවේදී'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) ''ආයුර්වේද සම්බාහන ශිල්පියා සහ සම්බාහන ශිල්පිනිය'' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම, ඒ වෙනුවට, ''ආයුර්වේද සම්බාහන ශිල්පී'' යන වචන ආදේශ කිරීමෙන්;

(4) ''ඩිප්ලෝමා'' යන වචනය පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට ''අභිඥාන පත්‍ර'' යන වචන ආදේශ කිරීමෙන්;

(5) ''ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති'' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට '' ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති'' යන වචන ආදේශ කිරීමෙන්;

(6) ''ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති'' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට '' ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති'' යන වචන ආදේශ කිරීමෙන්;

(7) ''ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකය'' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට ''ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨය'' යන වචන ආදේශ කිරීමෙන්;

(8) ''ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්විවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා'' යන වචන කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට ''ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ පීඨාධිපති'' යන වචන ආදේශ කිරීමෙන්.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''පොදු සංශෝධන සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතු ය''යි සෞඛ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**8. ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය''යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

**9. සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය''යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

**10. පනත් කෙටුම්පතක් ඉල්ලා අස්කර ගැනීමේ අවසරය:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 04 වශයෙන් දැක්වෙන, පහත සඳහන් පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීමට අවසර දිය යුතුය:—

''වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන)''

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම (බාල වරදකරුවන් සමාජගත කිරීමේදී මතු වන ගැටලු)**: ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 පසුකර තිබූයෙන් අ. භා. 6.26ට කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2023 සැප්තැම්බර් 06 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.